**සාරය:** සුමිහිරි දරුවනී, පරම පියාගේ ක්‍රියාකාරකම් සහ දරුවන්ගේ ක්‍රියාකාරකම් අතර වෙනස හඳුනාගන්න. පරම පියාට ඔබ හා ක්‍රීඩා කළ හැකියි, නමුත් ඔබ හා අනුභව කළ නොහැකියි.

**ප්‍රශ්නය:** "සත්‍යයේ ආශ්‍රයය ඔබව එගොඩ කරයි, නරක ආශ්‍රය ඔබව ගිල්වා දමයි" මෙහි අර්ථය කුමක් ද?

**පිළිතුර:** දැන් ඔබට සත්‍යයේ ආශ්‍රය තිබෙනවා, එනම්, ඔබේ බුද්ධියේ යෝගාව පරම පියා හා සම්බන්ධ කර තිබෙන හෙයින් ඔබට එගොඩ වීමට හැකි වේ. අනතුරුව, කෙමෙන් ඔබ ශරීරයේ අවධානයට එනවා, එතැනින් පටන් නොකඩවා පහළට බසින්නේ ඔබ ආශ්‍රය මගින් වර්ණවත් වූ හෙයින්ය. මේ නිසයි, කියමනක් ඇත්තේ: "සත්‍යයේ ආශ්‍රය ඔබව එගොඩ කරයි, නරක ආශ්‍රය ඔබව ගිල්වා දමයි" ඔබේ ශරීරය ඇතුළු සියලු ඥාති සම්බන්ධතා අමතක කරන්න. පරම පියාගේ ආශ්‍රයේ සිටින්න. එනම්, පරම පියා ස්මරණය කරන්න. එවිට ඔබ පියා මෙන්ම පාරිශුද්ධ වනවා ඇත.

ඕම් ශාන්ති. ඔබ දරුවන්ට දැන් පන්ති දෙකක් තිබෙයි. ඒක හොඳයි. එකක් තමයි, ස්මරණ වන්දනා ගමන තුළින් ඔබේ පාපයන් කැපී යාමත්, ඔබ ජීවයන් නොකඩවා පාරිශුද්ධ වීමත් වේ. දෙවැනි පන්තිය, එවන් වූ දැනුමයි. දැනුමත් පහසු වේ; දැනුමේ කිසි අපහසුතාවයක් නැත. ඔබේ මධ්‍යස්ථානත් මෙහෙත් අතර වෙනසක් ඇත. මෙහි පරම පියා හා දරුවන් සිටියි. මෙය පරම පියා හා දරුවන්ගේ සභාවයි. එහෙත් ඔබේ මධ්‍යාස්ථාන වල ඔබ දරුවන්ගේ සභාවයි. මේ නිසයි, මෙහි දරුවන් පුද්ගලිකවම පැමිණෙන්නේ. ඔබ ඔහුව ස්මරණය කළා වුවත්, මෙහිදී ඔහුව ඔබ ඉදිරියේ දකී; මම ඔබ සමග ඉඳිමි, මම ඔබ සමග කතා කරමි. පියා මේ පැහැදිලි කරන්නේ පරම පියාගේ ක්‍රියාකාරකම් සහ දරුවන්ගේ ක්‍රියාකාරකම් අතර වෙනසක් තිබෙනවා යන්නයි. මදක් සිතන්න පියාගේ භූමිකාව කුමක් ද, රථයේ භූමිකාව කුමක්ද කියා. රථය තුළින් ඔහුගේ භූමිකාව කළ හැකි ද? ඔව්, පියාට ඔහු තුළින් එය කළ හැකියි. ඔබ කියයි, "මම ඔබ සමග ඉඳිමි" ඒ වාගේම ඔබ කියයි: "මම ඔබ සමග අනුභව කරමි" කෙසේවෙතත්, ඔහු අනුභව නොකරයි. පරම පියාට වැටහෙනවා,"දරුවන් සමග ක්‍රීඩා කිරීම" යනු එම දෙදෙනොම ඔබ සමග ක්‍රීඩා කිරීමය. මෙහිදී ඔබ සමග ඔහු සෑම දෙයක්ම කරයි, ඒ ඔහු පරම ගුරුවරයා ද වූ නිසාය. ඔය දරුවන්ව විනෝදවත් කිරීම ගුරුවරයෙකුගේ යුතුකමය. එහි ගෘහස්ථ ක්‍රීඩාංගන තිබෙනවා. මෙකල, නොයෙක් වර්ගයේ ක්‍රීඩාවන් තිබෙනවා. චෙස් හා සමාන බොහෝ ජනප්‍රිය ක්‍රීඩා ඇත. එසේම මෙය මහාභාරත කතාවේ සඳහන් වේ. කෙසේවෙතත්, එය සූදු කෙළියකි. සූදු කෙළියේ යෙදෙන අය අසුවෙති. මේ සියල්ලම උපුටාගෙන තිබෙන්නේ භක්ති මාර්ගයේ ආගමික ග්‍රන්ථ වලින්ය. උපවාස හා පිළිවෙත් රැකීම ආදීන් ද, ඔබ දනී. ඒ සියල්ලක්ම භක්ති මාර්ගයට අයත් විෂයන්ය. ඇතැම් අය වතුර නොබී ටික දිනක් සිටිති. ඇතැම් අය වතුර හා කෑමෙන් තොරව ටික දිනක් සිටිති. භක්ති මාර්ගයේ යම් ලැබීමක් ඇත්නම්, එය තාවකාලිකව පමණි. මෙහි සෑමදේම ඔය දරුවන්ට පැහැදිලි කර තිබේ. ඔවුන් භක්ති මාර්ගයේ බොහෝ පැකිලෙමින් සිටිති. දැනුමේ මාර්ගය, සතුටට මාර්ගය වේ. පරම පියාගෙන් ඔබේ සතුටේ ප්‍රාප්තය ලබමින් සිටින බව ඔබ දැන් දනී. භක්ති මාර්ගයේ පවා ඔබ සිහිකළ යුත්තේ එක්කෙනාවයි. එක්කෙනා වන්දනා කිරීම පිරිසිදු වන්දනාවයි, එයත් හොඳයි. භක්තිය පවා සතෝ, රජෝ සහ තමෝ තත්ත්ව තුළින් යනවා. සියල්ලටම වඩා උසස්ම වන්දනාව ශිව් බාබාගේ සතෝගුණී භක්තියයි. ඔබ සියලුම දරුවන්ව ශිව් බාබා සතුටු දේශය වෙත ගෙන යන්නේ ඔහුම ඇවිත්ය. ඔවුන් කැඳවමින් සිටින කෙනාමයි, දරුවන්ට බෙහෙවින් සේවය කරමින්, ඔබව පාරිශුද්ධ කරමින් සිටින්නේ. අනතුරුව, ගල් බොරළු තුළත් ඔහු සිටිනවා යැයි ඔවුන් කියති. ඉතින්, ඒ අපහාස කිරීමකි. අසීමිත පියාගෙන් රාජධානියේ වාසනාව ඔබ දරුවන් ලබා ඇත. ඔබ යළිත් එය නිසැකවම ලබාවි. ඔබ භක්තියෙන් දැනුම වෙනස් වූවක් යැයි සලකනවා. රාම රාජධානිය කෙසේ පැවතුනේද රාවණ රාජධානිය කෙසේ පැවතුනේද යන්න ඔබේ උත්සාහය අනුව අනුපිළිවෙලින් ඔබ දනී. මේ නිසයි, මිනිසුන් හට සත්‍ය අවබෝධය ලැබීම පිණිස ඔබ පත්‍රිකා ආදිය මුද්‍රිත කර තිබෙන්නේ. ඔබ සතුව ඇති සියල්ලක්ම සත්‍යයි. ඔබ දරුවන් සේවය කරන්න ඕන. බොහෝ සේවය කිරීමට තිබෙනවා. සේවය සඳහා මෙම බැජ් එකත් වඩාත් හොඳය. මෙම බැජ් එක උසස්ම ග්‍රන්ථයකි. මේවා දැනුමේ විෂයන් වේ. මෙහිදී ඔබ ස්මරණ යාත්‍රාව වෙනම පැහැදිලි කළ යුතුවේ. මෙය නිහඬ ජප කිරීමකි. මෙහි ජප කිරීම වැනි දෙයක් නැත. ඔබට "ශිව, ශිව" කියා අභ්‍යන්තරයෙන් ජප කිරීමට උවමනා නොවේ; ඔබ සරලව පරම පියා සිහි කරන්නයි ඕන. එම ශිව් බාබා පරම පියා බවත් එවිට අප ජීවයන් ඔහුගේ දරුවන් බවත් ඔබ දනී. ඔහු පුද්ගලිකවම ඔබ ඉදිරියට ඇවිත් කියයි: මම පාරිශුද්ධකරුවා වෙමි, සෑම චක්‍රයේම මම ඔබව පාරිශුද්ධ කිරීමට එමි. ඔබේ ශරීරය ඇතුළු සියලු ශරීරධාරීන් අත් හැර ඔබව ජීවයක් වශයෙන් සලකන්න. ඔබේ පියා වූ මා ස්මරණය කරන්න. එවිට ඔබ පාරිශුද්ධත්වයට පත්වේවි. මාගේ භූමිකාව අපවිත්‍ර අයව පවිත්‍ර කිරීමයි. මෙම යෝගාව බුද්ධිය හා සම්බන්ධයි. එනම් පරම පියාගේ ආශ්‍රයයි. ඔබේ ආශ්‍රයෙන් ඔබ වර්ණ ගැන්වේ. සත්‍යයේ ආශ්‍රය ඔබව එගොඩ කරයි, නරක ආශ්‍රය ඔබව ගිල්වා දමයි, කියා කියමනක් ඇත. ඔබේ බුද්ධිය පියා හා සම්බන්ධ කිරීම මගින් ඔබට එගොඩ විය හැකියි. අනතුරුව ඔබ පහළ බහින්න පටන්ගනී. සත්‍යයේ ආශ්‍රය යැයි ඔහුගේ සිහිපත් කිරීමේ කියා ඇත. මෙහි තේරුම එම භක්ති මාර්ගයේ සිටින්නන් නොදනී. ඔබ ජීවයන්ට තමන් අපවිත්‍ර බවත් එම සදා පවිත්‍ර කෙනා සමග යෝගා කිරීම මගින් ඔබ පවිත්‍ර වන බව ඔබ ජීව වටහා ගෙන ඇත. පරමාත්ම පරම පියාව ජීවයන් ස්මරණය කරන්න ඕන. ජීවයක් පවිත්‍ර වූ කල, ඔහුට පවිත්‍ර ශරීරයක් ලැබේ. ඔහු නියමම රත්රන් බවට පත්වේ. මෙය ස්මරණ වන්දනාව වේ. ඔබේ පාප පිළිස්සී යාවි, එම යෝග ගින්නෙන් මිශ්‍ර වූ දේ ඉවත් වී යාවි. ඔබ නව ලොවේ නව යුගයේ පාරිශුද්ධ වී එසේම මුළුමනින්ම අකුසලෙන් තොර වී සිටි බව ඔබ දනී. ඔබ කලා 16න් පිරී සිටියා. දැන් කිසි කලාවක් ඉතිරි වී නැත. මෙයටයි රාහුගේ අපලය කියන්නේ. මුළු ලොව මතම රාහුගේ අපලය ඇත,

විශේෂයෙන් භාරතය මතයි. ශරීරය අවලස්සනයි. ඔය දැසින් දකින දේවලුත් අවලස්සනයි. රජ සහ රැජිනිය කෙසේද ජනයා ද එසේම වේ. කිසිවකුත් "කළු සහ සුන්දර" (ශ්‍යාම් සුන්දර්) යන්නෙහි අර්ථය නොදනී. ඔවුන් බොහෝ නම් දී තිබෙනවා. පරම පියා දැන් ඇවිත් එහි අර්ථය පැහැදිලි කරයි. ඔබ මුලින් ලස්සන වී සිටියා. අනතුරුව ඔබ අවලස්සන වුණා. ඔබ දැනුමේ ගින්න මත ඉඳීමෙන් ලස්සන වුණා. කෙසේවෙතත්, ඔබ අවලස්සන බවෙන් ලස්සන වීම සහ ලස්සන බවෙන් අවලස්සන වීමත් වෙන්න ඕන. මෙහි අර්ථය පරම පියා විසින් ඔබ ජීවයන්ට පැහැදිලි කළා. අප ජීවයන් ස්මරණය කරන්නේ එක් පියාවයි. ඔබ තිත් බව ඔබේ බුද්ධියට ඇතුල්වී ඇත. මෙයට ජීවය පිළිබඳ අවබෝධය කියති. අනතුරුව දැකීමට ඇතුළු නුවණ ඇත. මේ විෂයන් වටහාගෙන තිබෙන්න ඕන. ඔබ ජීවය ගැන වටහා ගන්න: මම ජීවයක්මි , මෙය මාගේ ශරීරයයි. මම මෙහි ඇවිත් ශරීරයකට ඇතුල්වුණේ මගේ කොටස කිරීමටයි. නාට්‍ය සැලැස්ම අනුව, අප පළමුව මෙහි ආවා. සියලු දෙනාම ජීවයන්ය. ඇතැම් අයට දීර්ඝ කොටස් තිබෙන අතර ඇතැම් අයට කෙටි කොටස් තිබේ. මෙය ඉතාමත් විශාල අසීමිත නාට්‍යයකි. ඔබ මෙහි අනුපිළිවෙලින් පැමිණි අයුරු සහ ඔබේ කොටස කරන්නේ කෙසේද යන්නත් ඔබ දනී. මුලින්ම දේවතා වංශය තිබුණි. ඉතාමත් සුබම සුබ කාලය වූ සංගම් යුගයේ දී ඔබ මෙම දැනුම ලබනවා. අනතුරුව අවසානයේ, මේ කිසිවක් ඔබට මතක් නොවේ. පරම පියා විසින් කියයි: මෙම දැනුම අතුරුදහන් වේවි. දේවතා ධර්මය බිහිවුණේ කෙසේද යන්න කිසිවකුත් නොදනී. ඔබ දරුවන් මෙය දන්නා අතර ඔබ අන් අයවත් ඔබට සමාන කරයි. ඔබේ පිරිස අධික වූවිට, ශබ්ද විකාශන යන්ත්‍රයක් භාවිත කිරීමට සිදුවනු ඇත. අනිවාර්යෙන් ක්‍රමයක් මතුවේවි. ඔබට විශාල ශාලාවක් ද උවමනා වේවි. පෙර චක්‍රයේ කුමන ක්‍රියාවක් ඔබ කළේ ද යළිත් ඔබ එය කරනවා ඇත. ඔබ මෙය වටහාගෙන ඇත. ඔබ දරුවන්ගේ සංඛ්‍යාව නොකඩවා වැඩි වේවි. බාබා, මංගල උත්සව සඳහා ශාලා ඉදිකරන්නන්ට පැහැදිලි කරන්නැයි ඔබට කියා ඇත. මෙහි ධර්මශාලා ආදියත් ඔවුන් මංගල උත්සව සැමරීමට ගනී. අපගේ කුලයට අයත් අය මෙය ඉක්මණින් වටහා ගනීවි. මෙම කුලයට අයත් නොවනා අය බාධා කරාවි. මෙම කුලයට අයත් අය මෙයමයි සත්‍යය කියා පිළිගනිති. මෙම ධර්මයට අයත් නොවන්නන් සටන් කරාවි. මෙම සිරිත් විරිත් සැමවිටම තිබූ දෙයක් යැයි කියති. අපවිත්‍ර පවුල් මාර්ගය ඇත්තේ දැන්ය. ඔබව යළිත් වරක් පවිත්‍ර කිරීම පිණිස පරම පියා ඇවිත් සිටිනවා. ඔබ පාරිශුද්ධත්වය ප්‍රබල ලෙස ඉස්මතු කරන නිසයි, එහි බොහෝ බාධක ඇත්තේ. ඔවුන් ආගාකාන්ට බොහෝ ගෞරවය දක්වති. පාප් වහන්සේට ද බොහෝ ගෞරව කරති. පාප්තුමා ඇවිත් කළේ කුමක්ද කියා ඔබ දනී. ඔහු සියදහස් ගණන් විවාහයන් කර දී තිබෙයි; මංගල උත්සව බොහෝ පැවැත් වේ. පාප්තුමා ඇවිත් අත් පළඳනාවක් බඳී. එම මිනිසුන් මෙසේ කිරීම ගෞරවයක් ලෙස සලකති. ඔවුන් මෙම විවාහ උත්සව සඳහා ප්‍රබල ජීවයන්ටත් ආරාධනා කරති. මෙකල ඔවුන් විවාහ තීන්දු කිරීමේ උත්සව පවා සමරති. පරම පියා කියයි: රාගය විශාලතම සතුරා වේ. මෙම නියෝගය ඔබේ නැන්දලාගේ ගෙදර යනවා වාගේ ලෙහෙසි නොවේ. පැහැදිලි කිරීමට ඉතා හොඳ උපක්‍රම අවශ්‍ය කරයි. මෙසේ ඔබ වර්ධනය වනවිට, ඔවුන් ටිකෙන් ටික තේරුම් ගන්න පටන් ගනී. මුල්ම හින්දු ආගමිකයන්ට පැහැදිලි කරන්න. ඔවුන් ඉක්මණින් මෙය වටහා ගන්නා අතර මෙයයි ආදි සනාතන දේවතා ධර්මය යැයි ද හින්දු ආගම නොවෙයි කියාත් වටහා ගනී. ඔබ පරම පියා කෙරෙන් දැනගත් අයුරින්ම, අන් අයත් එමෙන්ම වටහාගන්නා අතර පැතිරීම නොකඩවා සිදුවේවි. නොකඩවා පැල සිටුවීම සිදුවේ යන විශ්වාසය ඔබට ඇත. ඔබ පරම පියාගේ ශ්‍රීමත් අනුගමනය කිරීම මගින් දේවතා බවට පත්වේ. ඔවුන් නව ලොවේ වාසය කරන්නන් වේ. සංගම් යුගයේ පරම පියා ඇවිත් ඔබව මාරු කරන බව ඔබ කලින් දැන සිටියේ නැහැ. ඔබ මෙය කොහෙත්ම දැන සිටියේ නැහැ. සැබැවින්ම සුබදායී සංගම් යුගය මෙයයි කියා ඔබ දැන් තේරුම් ගෙන ඇත. ඔබ ඉතාමත් උසස් අය බවට පත්වෙමින් සිටිනවා. ඔබ කෙතරම් උත්සාහ කරයිද ඒ අනුව ඔබ පත්වනවා ඇත. ඔබ සැම කෙනෙක්ම තමන්ගේ හදවතෙන් අසන්න, පාසැලේදී මොනයම් විෂයකින් හෝ දුර්වල වූයේ නම්, එවිට ඔබ එම විෂයෙන් අසමත් වන බව ඔබ දනී. මෙයද පාඨශාලාවකි. ගීතා පාඨශාලා ඉතා ප්‍රසිද්ධය. ඔවුන් එම නම යාන්තමින් වෙනස් කර ඇත. "සත්‍ය ගීතාව සහ අසත්‍ය ගීතාව" කියා ලියූ කල ඔවුන් ව්‍යාකූල වේ. අනිවාර්යෙන්ම ගැටුමක් ඇතිවේවි. මේ ගැන බය වෙන්න උවමනා නැහැ. මෙකල බස් ආදිය පුළුස්සන එක මෝස්තරයක් වී ඇත. ඔවුන් නොකඩවා සැම දේටම ගිණි තබයි. කවුරු හෝ උගැන්වූ දෙයක් ඔවුන් උගනී. මිනිසුන් දැන් බොහෝ දේවල් ඔවුන් පෙර දැන සිටියාටත් වඩා ඉගෙන ගනිති. ඔවුන් වැඩ වර්ජනය ආදියත් නොකඩවා කරති. සැම වසරේම රජයට බොහෝ පාඩු සිදුවනවා ඒ හෙයින් වරිපනම්ද වැඩිවේ. දවසක බැංකු ආදියත් සැමගේ සේප්පුව විවෘත කරාවි, ඔවුන් නොකඩවා ඇති තරම් ආහාර සොයා ගබඩා කිරීමෙහි යෙදේ. ඔබ මේ සියලු දේ වලින් නිදහස් ය. ඔබේ ප්‍රධාන දේ තමයි ස්මරණ වන්දනාවේ යෙදීම. එම දේවල් හා කිසිම සම්බන්ධයක් තමාට නැතැයි පියා කියයි. මගේ යුතුකම ඔබට මාර්ගය පෙන්වීමයි, එවිට ඔබේ දුක් සියල්ල ඉවත් වී යාවි. මේ කාලයේ දී ඔබේ කර්ම ගිණුම් පියවී තිබේ. තවත් ඇති සියලු ලෙඩ රෝගයන් ද මතු වේවි. අවසානයේ කල කර්මයේ ගිණුම්ද පියවන්න සිදුවේ. ඔබ බිය නොවී සිටිය යුතුයි. ඔවුන් ලෙඩ වූ කල දෙවියන් සිහිකරන්න කියති. ඔබට මෙම දැනුම රෝහල් වලට ගොස් දිය හැකියි. පරම පියා ස්මරණය කරන්න එවිට ඔබේ පාප නැතිවී යාවි. මෙය හුදෙක් එක් උපතක දෙයක් නොවේ. ඔබ උපත් 21ක් නිරෝගීව සිටින බවට මම සහතික කරමි. එයද එක් පරම පියා ස්මරණය කිරීම මගින් ඔබේ ආයු කාලය දීර්ඝ වේවි. භාරතයේ මිනිසුන් දීර්ඝායුෂව සිටියා; ඔවුන් ලෙඩ රෝග වලින් නිදහස්ව සිටියා. පරම පියා දැන් ඔබව උසස් කිරීමට ශ්‍රීමත් දෙමින් සිටිනවා. "අති උසස් සහ සුබදායී" යන වදන් ඔබ කිසිවිට අමතක නොකරන්න. සැම චක්‍රයේම මෙසේ පත්වන්නේ ඔබමය. මෙය වෙන කිසිවකුටත් කිව නොහැකිය. මේ අයුරින් ඔබට බොහෝ සේවය කළ හැකිය. ඕනෑම වේලාවක වෛද්‍යවරු හමුවීම සඳහා වේලාවක්

නියම කළ හැකියි. රුකියා කරන අයට ද බොහෝ සේවය කළ හැකියි. රෝගීන්ට කියන්න වෛද්‍යවරයෙක් අප ළඟත් ඉන්නවා. ඔහු අවිනාශී අසීමිත ශල්‍ය වෛද්‍යවරයායි. අප දැන් උපත් 21ක් නිරෝගීමත් කරන එම කෙනාටයි අයිති වී සිටින්නේ. සෞඛ්‍ය අමාත්‍යවරයාට පැහැදිලි කරන්න: මිනිසුන් නිරෝගීව සිටින්න බොහෝ උත්සාහ කරමින් සිටිනවා. ස්වර්ණිම යුගයේ ඉතා ස්වල්ප ජනතාවක් සිටී. එහි සාමය, සතුට සහ පාරිශුද්ධත්වය තිබේ: එහි සෑම දේම තිබේ. මුළු ලොවටම යහපත ගෙනෙන්නේ ඔබ විසිනි. ඔබ මගපෙන්වන්නන් වේ. ඔබ පාණ්ඩව සමූහයයි. මෙය කිසිවකුගේත් බුද්ධියේ නොමැත. ආහාර අමාත්‍යවරයාටත් පැහැදිලි කරන්න. ශිව් බාබා සියල්ලන්ට වඩා උසස්ම ආහාර අමාත්‍යවරයා වේ. ඔහු බොහෝ ආහාර සපයනවා, දිව්‍යලෝකයේ කිසිවක් අඩු නැත. ඔබ දැන් සංගම් යුගයේ සිටියි. ඔබේ බුද්ධියේ මුළු චක්‍රයම පිළිබඳව ඇති නිසයි, ඔබට ස්ව දර්ශන චක්‍රධාරීන් යැයි අමතනුයේ. කෙසේවෙතත්, භාරතය ණය ගෙවාගත නොහැකි තත්වයට පත්ව ඇත. ඥානය ඇත්තා ඇවිත් නොකඩවා ඔබට ඔහුගේ ඥානය උගන්වමින් සිටින බව ඔබ දරුවන් දනී. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කාලයක් තිස්සේ නැති වී සිට මේ දැන් හමු වුණු ඔය දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය :**

1. එක් පියා ඔබේ මිත්‍රයා කර අත්විඳින්න: "මම ඔබ සමග ඉඳගනිමි, මම ඔබට පමණක් සවන් දෙමි, මම ඔබ සමග අනුභව කරමි" නරක ඇසුර අත් හැර සත්‍යයේ ඇසුරෙහි සිටින්න.
2. ස්මරණ වන්දනාව මගින් ඔබේ කර්ම ගිණුම සහ කර්ම විඳවීම් පියවන්න. මුළුමනින්ම පාරිශුද්ධ වන්න. සංගම් යුගයේදී ඔබව මුළුමනින්ම පරිවර්ථනය කරන්න.

**වරදානය:** නිත්- ස්වරූපයෙහි ස්ථාවරව ඉඳිමින් ඔබේ මනස සහ බුද්ධිය ඕනෑම නිශේධනීය බලපෑමෙන් සුරක්ෂිතව තබාගන්නා ඔබ විශේෂ ජීවාත්මයකි.

සෑම ඍතු වලම ඒ ඒ ඍතුවෙහි තමාව ආරක්ෂා කිරීම පිණිස විශේෂ සැලකිල්ලක් දක්වනවා, වැසි කාලය වූ විට, ඔබ කුඩයක්, වැහි කබායක් තබාගන්නවා. ඒ අයුරින්, වර්තමාන කාලයේ, මායා ඔබේ මනස සහ බුද්ධිය තුළට නිශේධනීය හැඟීම් සහ අදහස් නිර්මාණය කිරීමේ විශේෂ කාර්යයෙහි යෙදෙමින් සිටිනවා. එබැවින්, විශේෂයෙන් ආරක්ෂා මානයක් ඔබ යොදා ගැනීම අවැසි වේ. එය මැඩලීමට පහසු මාර්ගය වනුයේ ඔබ විසින් නිතක ස්වරූපයෙහි ස්ථාවර වීමයි. ප්‍රශ්ණාර්ථ ලකුණ හෝ ආශ්චර්ය ලකුණ යෙදීම වෙනුවට නැවතීමේ ලකුණක් තබා විශේෂ ජීවාත්මයක් වන්න.

**පාඨය :** සුවච කීකරු ජීවාත්මයක් වූ කලී සෑම සිතිවිල්ලකම, වචනයකම සහ ක්‍රියාවකම "එහෙයි මාගේ ස්වාමීනී" කියා කියන කෙනෙකි.

***** ඕම් ශාන්ති *****